ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

**නැගෙනහිර විශ්ව විද්‍යාලයේ සිසු සිසුවියන් සඳහා ඉහළ නංවන ලද ඉන්දීය මූල්‍යාධාර වැඩසටහනක් දියත් කෙරේ**

ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමා 2025 ඔක්තෝබර් 30 වන දින නැගෙනහිර විශ්ව විද්‍යාලයේ ආර්ථික වශයෙන් දුර්වල සමාජ කොට්ඨාසවල දක්ෂ සිසු සිසුවියන් සඳහා ඉන්දීය ප්‍රදාන යටතේ ඉහළ නංවන ලද මූල්‍යාධාර වැඩසටහනක් දින දියත් කළේය.

2. මෙයට පෙර කලින් අධ්‍යයන වර්ෂය සඳහා ඉන්දීය ප්‍රදාන යටතේ ආර්ථික පසුබිම සහ අධ්‍යයන දක්ෂතා මත පදනම්ව විශ්ව විද්‍යාලයෙන් තෝරා ගත් සිසු සිසුවියන් 100ක් සඳහා මසකට රුපියල් 5000 බැගින් වන ශිෂ්‍යත්වයක් ක්‍රියාවට නංවා තිබිණ.

3. මෙම ශිෂ්‍යත්ව වැඩසටහන සම්බන්ධයෙන් ඉතා ධනාත්මක ප්‍රතිචාර හිමි වූ අතර මෙම යෝජනාක්‍රමය තවදුරටත් ව්‍යාප්ත කරන ලෙස සහ ඉහළ නංවන ලෙස විශ්ව විද්‍යාල බලධාරීන්ගෙන්, සිසු සිසුවියන්ගෙන් සහ ඔවුන්ගේ පවුල්වලින් ඉල්ලීම් රැසක් ඉදිරිපත් විය. ශ්‍රී ලංකා ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා විසින් 2024 දෙසැම්බර් මස සිදු කළ ශ්‍රී ලංකා සංචාරය අතරතුරදී අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් නිවේදනය කළේ ඉන්දියාව නැගෙනහිර විශ්ව විද්‍යාලයේ සහ යාපනය විශ්ව විද්‍යාලයේ විද්‍යාර්ථයින් සඳහා වන ශිෂ්‍යත්ව යෝජනාක්‍රමය ඉහළ නංවන බවයි.

4. ඒ අනුව, ඉහළ නංවන ලද ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය යටතේ වර්තමාන අධ්‍යයන වර්ෂයේ සිට සෑම වසරකම පළමු වසරේ ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් 100 දෙනෙකු සඳහා මසකට රුපියල් 7500 බැගින් ඔවුන්ගේ අධ්‍යයන පාඨමාලා අවසන් වන තෙක් ලබා දෙනු ඇත. ඒ අනුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන සිව් වන වසර වන විට විශ්ව විද්‍යාලයේ සිසු සිසුවියන් 400 දෙනෙකුට ශිෂ්‍යත්ව හිමි වනු ඇත.

5. ඔක්තෝබර් 30 වන දින පැවති උත්සවය අමතමින් මහ කොමසාරිස්තුමා ප්‍රකාශ කළේ මෙම යෝජනාක්‍රමය නැගෙනහිර පළාතේ සමාජ ආර්ථික වර්ධනයට සහයෝගය ලබා දීම සඳහා ඉන්දියාව විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන

සහයෝගිතා මුලපිරීම් අතරින් එකක් බවයි. මෙම අවස්ථාවේ අදහස් දක්වමින්, නැගෙනහිර විශ්ව විද්‍යාලයේ උප කුලපති මහාචාර්ය පී. පරෙතීපන් මහතා සහ ශිෂ්‍ය නියෝජිතයෝ ලබා දෙන මූල්‍ය සහයෝගය වෙනුවෙන් ඉන්දිය රජයට සිය මහත් කෘතවේදීත්වය පිරිනැමූහ. මෙම මූල්‍යාධාර වැඩසටහන විද්‍යාර්ථයන්ගේ මූල්‍ය පීඩනය අවම කිරීමටත්, විශ්ව විද්‍යාල දේශන සඳහා පැමිණීම වර්ධනය කිරීමටත් අධ්‍යයන කටයුතුවල සාර්ථකත්වය ඉහළ නැංවීමටත් මහත් පිටිවහලක් වන බව ඔවුහු ප්‍රකාශ කළහ.

****

**කොළඹ**

***2025* ඔක්තෝ*බර් 30***